3 වන පිටෙන්

මිනියක් කුණු වීමෙන් නැගෙන දුර්ගන්දය ඉවසිය නොහැකි ආකාරයෙන් ආණ්ඩු පක්ෂයේ දුර්ගන්දයත් ජනතාවට ඉවසිය නොහැකි දිනය වැඩි ඈතක නොවන බව විපක්ෂයේ මතයයි.

මේ වන විටත් විපක්ෂය තුල අභ්‍යන්තර අර්බුදයක් නිර්මාණය කර තිබෙන සජිත් ප්‍රේමදාස පාර්ශවය විසින් පිරිසිදු එක්සත් ජාතික පාක්ෂිකයන් එක්සේසත් කර අවසානයේ ආණ්ඩු බලය ලබා ගනීවි යැයි ඇතැම් අය සිතා සිටියි. නමුත් මේ අභ්‍යන්තර අර්බුදයේ වාසිය ඇත්තටම බුක්ති විදින්නේ සජිත් පාර්ශවය නොව රනිල් වික්‍රමසිංහ පාර්ශවයයි. විපක්ෂයේ අභ්‍යනතර අර්බුදය උත්සන්න වන්න වන්න එ.ජා.ප පාක්ෂිකයන් විසින් ආණ්ඩුව පෙරළා දැමිය යුතු බවට වූ සටන් පාඨය පසෙක දමා පක්ෂයේ සමගිය රැක ගැනීමට වැඩි උනන්දුවක් දක්වන නිසා ආණ්ඩු බලය ලබා ගැනීමේ එ.ජා.ප ව්‍යපෘතිය දිනෙන් දින කල් දැමීමට අවස්ථාවක් උදාවී ඇත. ඒ මගින් ආණ්ඩු පක්ෂය අභ්‍යන්තරයෙන් කුණු වී ඕජස් ගලන මට්ටමට ලංවූ වහාම විපක්ෂයේ අර්බුදයන් වහාම නිරාකරණය කර ගනිමින් ජනතාවට එපා වූ කුණුවී ගඳ ගහන රජය පෙරළා දැමීම විපක්ෂයේ දීර්ඝකාලින දේශපාලන සැලසුම බව දැන ගන්නට ලැබේ.

සජිත් ප්‍රේමදාස විසින් ඇතිකර තිබෙන තුවාලය බෙටඩීන් දමා ශුද්ධ පවිත්‍ර කර තුවාලය සුව කිරීමට රනිල් පාර්ශවය විසින් කටයුතු නොකරන්නේ මේ තුවාලය වන වන්නට වන් වන්නට එහි වාසිය තමන්ට ලබා ගත හැකි බැවිනි. මේ කුණු වූ තුවාලයෙන් ඇතැම් විට එළියට හිස දමන කිලි මහරාජා, සෝමා එදිරිසිංහ වැනි මේ තුවාලයේ සැරව වලින් ජීවත් වන මාධ්‍ය ආයතන ප්‍රධානීන් විසින් කියන කතා විපක්ෂය විසින් ඒ තරම් මායිම් නොකරන්නේ ඔවුන් දීර්ඝ කාලීනව සිය දේශපාලන ව්‍යපෘතිය මේ වන විටත් සැලසුම් කර තිබෙන බැවිනි.

www.3mana.com




**සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න**

03 8707 4604 / 0402 025 516

**email** sannasanews@gmail.com ads.sannasa@gmail.com

